# වැලිගම නගර සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට වැලිගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් 2013 ජුනි 06 දින පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.1,463,200 ක් වූ WPRD 4473 දරන රෝද 04 වැඩේ ට්‍රැක්ටරයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ගිණුමෙහි වටිනාකම රු.33,161,493 ක් වූ අතර ප්‍රාග්ධන යෙදූමට ආදායමින් දායකවීමේ ගිණුමෙහි වටිනාකම රු.33,546,620 ක් වූයෙන් රු.385,127 ක වෙනසක් විය.

(ඇ) (I) සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,539,175 ක් වූ තොගය වර්ගීකරණයකින් තොරව පොදු ගබඩා යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට රු.31,950 ක් වූ අතැති ඖෂධ තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ පුස්තකාල පොත් වටිනාකම රු.26,200 කින් අඩුවෙන් සටහන් වීමේ වරද නිවැරදි කිරීම සඳහා එම ගිණුම හර කර ප්‍රාග්ධන යෙදූමට ආදායමින් දායකවීමේ ගිණුම බැර කළයුතු වුවද, ජර්නල් සටහන් අංක 01 මගින් ප්‍රාග්ධන යෙදූමට ආදායමින් දායකවීමේ ගිණුම හර කර

පුස්තකාල පොත් ගිණුම බැරකර තිබුණෙන් එකී වරද නිවැරදි වී නොතිබූ අතර එම ගිණුම් අතර වෙනස රු.52,400 කින් ද්විගණනය වී තිබුණි.

(ඉ) 2012 වර්ෂය වෙනුවෙන් රු.128,548 ක් වූ විනෝද බදු සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ අතර එම ලැබීම මුදල් පොත හර කර ආදායම් ණයගැති ගිණුම බැර කරනු වෙනුවට ජර්නල් සටහන් අංක 94 මගින් අතිරික්තතා හා ඌනතා ගිණුම හර කර විනෝද බදු ගිණුම බැර කර තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ජර්නල් සටහන් 101 ක් තිබුණද ප්‍රධාන ලෙජරයෙහි ජර්නල් සටහන් 109 ක් වූ අතර ජර්නල් සටහන් 08 ක සටහන් නොවූ ගනුදෙනු වටිනාකම රු.1,248,668 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එම වරද නිවැරදි කර නොතිබුණි.

(උ) ජර්නල් සටහන් 66 මගින් කඩකුලී පාලන ගිණුමේ බිල්කිරීම් රු.1,493,272 ක් වූ වටිනාකම කඩකුලී ආදායම් ගිණුමට බැර කරනු වෙනුවට ටෙන්ඩර් බදුකුලී ගිණුම බැරකර තිබූ අතර එය නිවැරදි කිරීමේදී නැවතත් ජර්නල් සටහන් අංක 136 මගින් ටෙන්ඩර් බදුකුලී ගිණුම බැරකර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල වූ රු.77,261,152 ක මුදල මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර නොතිබුණි.

(එ) 2011 සහ 2012 වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු රු.981,295 ක මුදල සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්
---------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 08 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.10,899,604 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව හා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.7,997,947 ක් වූයෙන් වෙනස රු.2,901,657 ක් විය.

(ආ) ආදායම් විෂයයන් 07 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.9,301,493 ක් වූ අතර කාණ්ඩ එකතු ලේඛනය අනුව වටිනාකම රු.9,197,215 ක් වූයෙන් වෙනස රු.104,278 ක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.5,743,425 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.81,081,150 ක් විය.

1.3.5 නිරවුල් නොකල ගිණුම්
---------------------------

(අ) සභාව විසින් 2013 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව රු.11,591,157 ක් වටිනාකම වූ ගිණුම් ශේෂයන් 12 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පොදු සැපයුම් ණයහිමියෝ රු.1,778,698 ක් වූ අතර මෙහි ඉකුත් වර්ෂ 07 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.456,567 ක ගබඩා ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු ආදායම් ණයගැතියෝ රු.71,569,257 ක් වූ අතර මෙම වටිනාකම තුල ඉකුත් වර්ෂ 07 කට පෙර සිට එන රු.50,868,411 ක් වූ ණයගැති ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.148,974,556 ක් වටිනා ගිණුම් විෂයයන් 09 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

1.3.7 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි. | |
| (i) මු.රෙ.387 | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව බැංකු ගිණුම්වල අයිරාවක් පවත්වාගෙන යා නොහැකි වුවත් මුදල් පොත අනුව බැංකු ගිණුම් 03 ක රු.11,223,103 ක වටිනාකමක් වූ අයිරා පවත්වාගෙන යමින් තිබුණ අතර 2012 හා 2013 වසර වෙනුවෙන් රු.393,867 ක අයිරා පොලී ගෙවා තිබුණි. |
| (ii) මු.රෙ.507 | අතැති තොගවල අගය වාර්ෂිකව ගිණුම්වල ඇතුළත් කිරිම සඳහා වර්ෂය අවසන් දිනට භෞතිකව සත්‍යාපනය කර ස්ථාවර වත්කම් වල පැවැත්ම පිළිබඳ ප්‍රකාශයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක යන්ත්‍ර වලට අදාල උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.319,552 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.8,799,151 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම්, හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| --- | --- | --- | --- |
| | රු. 000 | රු.000 | රු. 000 |
| වරිපනම් හා බදු | 7,800 | 7,416 | 4,845 |
| කුලී මුදල් | 12,317 | 7,417 | 1,371 |
| බලපත්‍ර ගාස්තු | 803 | 904 | 336 |
| වෙනත් ආදායම් | 46,702 | 36,048 | 89,212 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2013 ජනවාරි 01 දිනට හිඟ ශේෂය | 2013 වර්ෂයට බිල්කල මුදල | 2013 වර්ෂයේ අයවීම් | | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | |
| --- | --- | --- | --- | --- | --- | --- |
| | | | 2013 වර්ෂයේ බිල්කිරීම් ලැබීම් | 2012 හා ඊට පෙර හිඟ මුදලින් අයවීම් | 2013 වර්ෂයට අදාල හිඟ මුදල | 2012 හා ඊට පෙර වර්ෂ |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 5,103 | 5,906 | 3,503 | 2,659 | 2,402 | 2,443 |
| ටෙන්ඩර් බදුකුලී | 60 | 2,457 | 2,347 | 60 | 109 | - |
| කඩකුලී | 903 | 1,553 | 1,085 | - | 468 | 903 |

### 2.2.3 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය ආරම්භක වරිපනම් බදු හිඟ ශේෂය රු.5,103,124 ක් වූ අතර 2013 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයකර ගෙන තිබූ මුදල රු.2,659,619 ක් වූයෙන් හිඟ මුදලින් අයකර ගෙන ඇති මුදල සියයට 52 ක් පමණක් විය.

2013 වර්ෂයට අදාල වරිපනම් බදු බිල්කල වටිනාකම රු.5,906,332 ක් වූ අතර 2013 වර්ෂයේ අයකිරීම් රු.3,503,892 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල්කිරීම් වලින් අයකරගෙන තිබුනේ සියයට 59 ක් පමණක් විය.

### 2.2.4 බදුකුලී

සමාලෝචිත වර්ෂයේ බදු කුලී බිල්කිරීම් වටිනාකම රු.2,457,377 ක් වූ අතර වර්ෂයට අදාල අය වූ මුදල රු.109,408 ක් වූයෙන් වර්ෂය තුල අයවීම් වල ප්‍රතිශතය සියයට 4 ක් පමණක් විය.

2.2.5 කඩකුලී
---------
සමාලෝචිත වර්ෂයේ කඩකුලී, බිල්කිරීම් වටිනාකම රු.1,553,722 ක් වූ අතර වර්ෂය තුළ අයකිරීම් රු.1,085,024 ක් වූයෙන් අයවීම් ප්‍රතිශතය සියයට 69 ක් පමණ විය. වර්ෂය ආරම්භයේ හිඟ මුදල වූ රු.903,038 ක මුදලින් 2013 වර්ෂයේ කිසිදු මුදලක් අයවී නොතිබුණි.

2.2.6 ප්‍රචාරක දැන්වීම් ගාස්තු
-------------------------
සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් 8 කින් රු.52, 620 ක් අයකරගෙන තිබූ අතර 2012 ජූලි 12 දිනැති අංක එස්එන්/එම්ආර්/බී/වැලි.න.ස./වි./2012/01(11) දරන විමසුමෙන් නිරීක්ෂණය කරන ලද රු.800,175 ක මුදල අයවී නොතිබුණි.

2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (අ) | උසාවි දඩ | 164,069 |
| (ආ) | මුද්දර ගාස්තු | 7,781,611 |

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කාර්ය මණ්ඩල පරිපාලනය
--------------------------------

(අ) 2013 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු මෙසේය.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | අතිරික්ත |
|---|---|---|---|
| විධායක | 05 | 05 | |
| ද්විතියික | 32 | 32 | |
| ප්‍රාථමික | 91 | 92 | 01 |
| අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් | 10 | 25 | 15 |
| | 138 | 154 | 16 |

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා වූ වියදම රු.33,391,216 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ රු.31,393,729 ක් පමණක් වූයෙන් වෙනස රු.1,997,487 ක් විය.

(ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ පිළිවෙලින් 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 මඟින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක, හා කොන්ත්‍රාත් සේවකයින් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 25 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සහා අරමුදලින් රු.2,017,613 ක් ගෙවා තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 1997 සිට 2010 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.3,433,089 ක විගණන ගාස්තු 2014 අප්‍රේල් 09 දින වන විටත් ගෙවා නොතිබුණි.

(ආ) නගර සභා බල ප්‍රදේශය තුල නඩත්තු කරන අනුමත වීථි පහන් සංඛ්‍යාව 840 ක් වුවත් නඩත්තු කරනු ලබන වීථි පහන් සංඛ්‍යාව පිළිබඳව සමීක්ෂණයක් සිදුකර තථ්‍ය ප්‍රමාණය හඳුනා ගෙන නොතිබුණි. තවද 2012 හා 2013 වර්ෂ සඳහා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම් අත්සන් කර තිබූ නමුත් 2012 වර්ෂයේ ඉල්ලුම් කරන ලද රු.136,616 ක් ද 2013 වර්ෂයට අදාලව රු.98,676 ක මුදලද ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව අයවැයගත ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරික්ෂණ වූයෙන් සභාවේ අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන තිබුණ බවට නිරික්ෂණය නොවීය.

4.2 නොවිසඳී ඇති විගණන විමසුම්

2013 වර්ෂයේදී සභාව වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 4 කින් නිරික්ෂණය කර ඇති කරුණු 2014 ජුනි 05 දින දක්වා සමථයකට පත්වී නොතිබුණි.

5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය